# සාමාන්‍ය සමයේ විසිපස්වන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

එස්රාගේ පොතෙන් ගත් පාඨයෙකි.

එස්රා 9 : 5–9

"අපේ වහල්කමේ දී දෙවියන් වහන්සේ අප අත් නොහැරිය සේක."

"සවස පූජාව පවත්වන වේලාව පැමිණි විට, මම මාගේ සිහි නැති භාවයෙන් නැඟිට, ඉරාගත් මාගේ වස්ත්‍රය ද මාගේ සළුව ද ඇතිව දණින් වැටී, මාගේ දෙවි සමිඳාණන් වහන්සේ දෙසට මාගේ අත් විහිදාගෙන කතා කොට, "මාගේ දෙවියන් වහන්ස, මම ලජ්ජාවට පත් වී මාගේ දෙවි වන ඔබට දෙසට මාගේ මුහුණ ඔසවන්නට බියෙන් සිටිමි. මන්ද, අපගේ ද්‍රෝහිකම අපේ හිස්වලටත් ඉහළින් නැඟී ගොස් තිබේ. අපේ පියවරුන්ගේ කාලයේ පටන් අද දක්වා අප අතිශයින් වරදකාරයන් ව සිට, අපේ අපරාධ නිසා, අපි ද අපේ රජවරු ද අපේ පූජකයෝ ද අද දවසේ තිබෙන හැටියට විදේශවල රජවරුන් අතටත්, කඩුවටත්, වහල් කමටත්, කොල්ලකෑමටත්, විලිලජ්ජාවටත් පාවා දෙනු ලැබීමු.

අද අපේ දුඃඛිත තත්ත්වය එයයි. එහෙත් දැන් ස්වල්ප වේලාවකට අපේ දෙවි සමිඳාණන් වහන්සේ අපට කරුණා කොට, අපෙන් ස්වල්ප දෙනෙකුට ඉතිරිව සිටින්නටත් මේ ශුද්ධ ස්ථානයේ සුරැකිව විසීමටත් ඉඩ දී තිබේ. අපේ දෙවියන් වහන්සේ අපට නව ජීවිතයක් ද අපේ වහල්කමේ දී අපට තරමක සහනයක් ද දී ඇත්තේ මේ අන්දමට ය. මන්ද, අපි වහල්ලු ය. එහෙත් අපේ වහල්කමේ දී අපේ දෙවියන් වහන්සේ අප අත් නොහැර, අපේ දෙවියන් වහන්සේගේ මාළිගාව ගොඩනැඟීමටත්, එහි කැඩුම් බිඳුම්

ප්‍රතිසංස්කරණය කිරීමටත්, ජුදාහි ද ජෙරුසලමෙහි ද අපට සුරැකිව විසීමටත් පර්සියාවේ රජවරුන් අභිමුවෙහි අපට කරුණාව පෙන් වූ සේක.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

තෝබිත් 13 : 2-4, 6-8

පිළිතුර: සදා ජීවනයේ දෙවි සමිඳාණන්ට පැසසුම් වේවා.

ගීය:

දෙවි සමිඳාණන් වහන්සේ දඬුවම් දෙන සේක.
ඉන්පසු දයා පාන සේක.
එතුමාණෝ පාතාල ලොවේ පතුලට මිනිසුන් යවන සේක.
මහා විනාශයෙන් ඔවුන් ගලවා ගන්න සේක. එතුමන්ගේ බලයෙන් බේරීමට කිසිවෙකුට බැරි ය.

එතුමාණන් ඔබ ජාතීන් අතර විසුරුවා දැමුව ද, එහිදී පවා එතුමාණෝ සිය මහත්තත්ත්වය ඔබට පෙන්වූ සේක.
සියල් ජීවතුන් අබිමුව උන් වහන්සේ උසස් කරන්න.
එතුමාණෝ අපේ සමිඳාණෝය. එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය.
එතුමාණෝ අපේ පියාණෝ ය. එතුමාණෝ සදහට ම දෙවියන් වහන්සේ ය.

ඔබේ මුළු සිතින් හා මුළු හදින් එතුමන් වෙත අවංකව හැසිරෙමින් ඔබ එතුමන් වෙත හැරී එන්නහු නම්, එතුමාණෝ ද ඔබ වෙත හැරී එන සේක. තවදුරට මුහුණ සඟවා නොගන්න සේක.

කොපමණ හොඳින් ඔබට එතුමාණෝ සත්කාර කළ සේක් ද යන්න ගැන කල්පනා කරන්න.

හඬනගා එතුමන්ට තුති දෙන්න. යුක්තියේ සමිඳුන් පසසන්න.
සදාතන රජතුමාණන් උසස් කරන්න.
පව්කළ ජාතියකට එතුමන්ගේ බල සහ මහන්තත්ත්වය දන්වමි.
පව්වුනි, එතුමන් වෙත හැරී එන්න. එතුමන් අබිමුව ඔබේ හැසිරීම දැහැමි වේවා! දැහැමි වන විට එතුමාණන් ඔබට කරුණාව පානු ඇත. ඔබට අනුකම්පාව දක්වනු ඇත.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුස් වහන්සේගේ දහම් පණිවුඩය අප තුළ සියලු ප්‍රඥාවෙන් සමෘද්ධව පවතීවා!
උන්වහන්සේ තුළින් දෙවි පියාණන් වහන්සේට ස්තුති කරමු.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ.
දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය. මනස්ථාපනය වී සුබ අස්න අදහා ගන්න.
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 9: 1–6

“දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කරනු පිණිසත් රෝගීන් සුව කරන පිණිසත් ජේසුස් වහන්සේ දොළොස් දෙන යැවූ සේක.”

එකල ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් දොළොස් දෙනා කැඳවා, සියලු යක්ෂයන් කෙරෙහි බලය හා ආධිපත්‍යය ද රෝගීන් සුව කිරීමේ වරය ද පවරා දී දෙවියන් වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කරන පිණිසත්, රෝගීන් සුව කරන පිණිසත් ඔවුන් යැවූ සේක. තවද උන්වහන්සේ ඔවුන්ට කතා කොට “චාරිකාව සඳහා කිසිවක් නොගන්න. සැරයටිය වත්, මල්ලක් වත්, රොටියක්වත්, මිල මුදල් වත්, කමිස දෙකක් වත් නොගන්න. ඔබ යම් කිසි නිවසකට පිවිසි කල, එතැනින් පිටත්ව යනතුරු එහිම නැවතී සිටින්න. ඔබ නොපිළිගන්නා යම් පමණ දෙනෙක් ඇද්ද, ඒ නුවරින් නික්ම යන කල ඔවුන්ට විරුද්ධව සාක්ෂියක් වන පිණිස ඔබේ පාද යට තිබෙන දූලි ගසා දමන්නැ”යි වදාළ සේක. ඔව්හු පිටත්ව රට පුරා සුබ අස්න දේශනා කරමින් ද රෝග සුව කරමින් ද ගමින් ගමට ගියහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.